සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 2 |

**උපදෙස් :**

* **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**

1. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ ප්‍රථම විශ්වවිද්‍යාලය වනුයේ,
   (1) ඉලිනොයිස් විශ්වවිද්‍යාලය. (2) කැලණිය විශ්වවිද්‍යාලය.
   (3) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය. (4) පෙන්සෙල්වේනියානු විශ්වවිද්‍යාලය.
   (5) මෙල්බර්න් විශ්වවිද්‍යාලය.

2. සන්නිවේදන අධ්‍යයනයෙහි ශාස්ත්‍රීය සංවර්ධනයට අවශ්‍ය පදනම සකස් කිරීමට කටයුතු කළ ඉංජිනේරුවන් වන්නේ,
   (A) ක්ලෝඩ් ෂැනොන්. (B) කාල් හවුලන්ඩ්. (C) විල්බර් ශ්‍රාම්.
   (D) ජෝර්ජ් ගාබ්නර්. (E) වොරන් වීවර්.
   (1) AB (2) CD (3) DE (4) AE (5) AD

3. "වෙනස්කම්වලට අනුරූපව සන්නිවේදනයේද වෙනස්කම් ඇතිවිය හැකිය." ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ,
   (1) සන්නිවේදනය අරමුණු සහගත වනබවයි. (2) සන්නිවේදනය සංකේතාත්මක වන බවයි.
   (3) සන්නිවේදනය ක්‍රියාපටිපාටියක් වන බවයි. (4) සන්නිවේදනය විවිධාකාර වන බවයි.
   (5) සන්නිවේදනය බල සාධකයක් වන බවයි.

4. සන්දේශයක් ගොඩනැගීමට පදනම් වන සාධක වන්නේ,
   (A) සංඥා (B) සංකේත (C) කේත (D) නියාමන (E) ප්‍රතිමාන
   (1) ABCD (2) BCDE (3) ABCE
   (4) ABDE (5) ACDE

5. වෙළෙඳ දැන්වීම්කරුවන් විසින් මාධ්‍ය අන්තර්ගතය, මාධ්‍යයේ කාලය හා අවකාශය මිලදී ගනු ලැබීමට පදනම් වී ඇති මාධ්‍ය ප්‍රවණතාව වන්නේ,
   (1) භාණ්ඩකරණයයි. (2) වාණිජකරණයයි. (3) පාරිභෝජ්‍යකරණයයි.
   (4) ගෝලීයකරණයයි. (5) මාධ්‍ය වෙළඳපළයි.

6. ඉරාන, ඊශ්‍රායල, ඇමරිකා යුද්ධය පිළිබඳ තොරතුරු වාර්තා කරන මාධ්‍යවේදියෙක් සන්දේශ සකස් කොට ඉදිරිපත් කිරීමෙන් නියෝජනය වන්නේ,
   (1) සන්නිවේදකයායි.   (2) ප්‍රතිපෝෂණයයි.   (3) විකේතකරණයයි.
   (4) බලපෑමයි.   (5) ආකේතකරණයයි.

7. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේදී පුද්ගල ස්මෘතික ශක්තිය වැදගත් වේ.
   (2) අන්තර් පුද්ගල සන්නිවේදනය මූලිකව සමාජ සම්බන්ධතා ගොඩනැගේ.
   (3) සමූහ යන්නෙන් අදහස් වන්නේ කුඩා පිරිසකි.
   (4) මහජන සන්නිවේදනයේදී ග්‍රාහක පිරිස විවිධ ජන කොට්ඨාශයන්ගෙන් සමන්විත විය නොහැක.
   (5) ජන සන්නිවේදනයේදී ග්‍රාහකයා විවිධ හා විෂම ජාතීය වේ.

8. පසුදින උත්සවාකාරයෙන් පැවැත්වීමට නියමිත පාසල් මාධ්‍ය දින උත්සවයේ පිළිගැනීමේ කතාව අමල්ට පවරා ඇත. තමන්ට පැවරුණු කාර්යය පිළිබඳ මිතුරන් සමග සාකච්ඡා කළ අමල් නිවසට ගොස්, මවගෙන් එහි තම නිරූපණය පිළිබඳ උපදෙස් ලබා ගනිමින් නින්දට ගියේ, උත්සවයේ විචිත්‍රත්වය සිතින් මවා ගනිමින් සිනා සෙමිනි.

   ඉහත අවස්ථාවේදී දැකිය හැකි සන්නිවේදන **වර්ග** හා **ස්වරූප** පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) සමූහ සන්නිවේදනය, කථන සන්නිවේදනය, රූපණය, අන්තර්වර්ති සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය.
   (2) සමූහ සන්නිවේදනය, වාචික සන්නිවේදනය, කථන සන්නිවේදනය, අන්තර්වර්ති සන්නිවේදනය, නිර්වාචික සන්නිවේදනය.
   (3) සමූහ සන්නිවේදනය, කථන සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය, රූපණය, අන්තර්වර්ති සන්නිවේදනය, නිර්වාචික සන්නිවේදනය.
   (4) මහජන සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, කථන සන්නිවේදනය, රූපණය, නිර්වාචික සන්නිවේදනය
   (5) මහජන සන්නිවේදනය, කථන සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය, රූපණය, අන්තර්වර්ති සන්නිවේදනය, නිර්වාචික සන්නිවේදනය.

9. මාධ්‍ය සම්බන්ධව පර්යේෂණ සිදු කිරීමට ගුරු භවතුන් හා සිසු දරුවන් යොමු කළ යුතු බව දක්වා ඇත්තේ,
   (1) ගෞන්වල්ට් ප්‍රකාශනයේය.   (2) යුනෙස්කෝ සංවිධානය විසින්ය.
   (3) විල්බර් ශ්‍රාම් විසින්ය.   (4) ශෝන් මැක්බ්‍රයිඩ් විසින්ය.
   (5) පැරිස් න්‍යාය පත්‍රයේය.

- පහත වගුව ඇසුරෙන් **10** සිට **13** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | මාධ්‍ය/ නාළිය | B | කථකයා/ සන්නිවේදකයා | C | ග්‍රාහකයා/ ශ්‍රාවකයා | D | අවස්ථාව |
| E | බලපෑම | F | බාධක / ඝෝෂා | G | සන්දේශය / කථාව | H | අර්ථ නිරූපණය |

10. ෂැනොන් විවර් ආකෘතිය මගින් මුල්වරට හඳුන්වා දුන් සන්නිවේදන මූලිකාංගය,

(1) A (2) F (3) B (4) C (5) G

11. ලැස්වෙල් ආකෘතිය මගින් වැඩි අවධානයක් යොමු කළ සන්නිවේදන මූලිකාංගය,

(1) B (2) E (3) A (4) C (5) G

12. සන්නිවේදන කාර්යය සඳහා තාක්ෂණික උපකරණ භාවිත නොවූ යුගයක සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කළ ආකෘතියට අදාළ අංග පමණක් දැක්වෙන වරණය,

(1) ABCDE (2) BGCED (3) GBCDE (4) BGDCE (5) BGCDE

13. විකේතකරය, ආකේතකරයබවට පත්වීමට පදනම් වන මූලිකාංගය හා ආකේතකරණය, විකේතකරණය යන ක්‍රියාකාරකම් සඳහා යොමු වන මූලිකාංග පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) HCB (2) EBC (3) ABC (4) FBC (5) HBC

14. A - ජනමාධ්‍යවල බොහෝ විට ප්‍රමාදිත ප්‍රතිපෝෂණයක් දක්නට ලැබේ.

B - ජනමාධ්‍යවලින් ඍජු පුද්ගල සන්නිවේදනයක් දැකිය හැකිය.

C - ජනමාධ්‍ය බහුවිධ දොරටු පාලන ක්‍රියාවලියකට යටත් වෙයි.

ඉහත ප්‍රකාශ අතරින් ජනමාධ්‍ය ක්‍රියාවලියට අනුගතව අදාළ විය හැක්කේ.

(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B, හා C යන සියල්ලම.

15. සාම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රමයක් ලෙස ගැමි නාටක පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) අදෘශ්‍යමාන වස්තූන් ඇමතීම හා ඒවායේ පිහිටක් ලබා ගැනීම.

(2) කිසියම් කතා පුවතක් පදනම් කර ගැනීම.

(3) ප්‍රදේශ අනුව විවිධතා පැවතීම.

(4) කවි කීම හා හිටිවන සංවාද උපයෝගී කරගැනීම.

(5) රංග භාණ්ඩ අදාළ පරිසරයෙන් උපයා ගැනීම.

16. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබළෙකුගේ භූමිකාව ජනමාධ්‍ය ඉටු කළ යුතුය. ඒ සඳහා පදනම් වන ඉදිරිපත් කිරීම වන්නේ,

(1) සංවාද හා සාකච්ඡාමය වැඩසටහන් පැවැත්වීම.

(2) ටෙලි නාට්‍ය විකාශනය කිරීම.

(3) වෙළඳ දැන්වීම් පළ කිරීම.

(4) රියැලිටි වැඩසටහන් පැවැත්වීම.

(5) දේශපාලන දූෂිත ක්‍රියාකාරකම් හෙළි කිරීම.

17. සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවලදී අපට බොහෝ විට පරිසරයෙන් ලබාගන්නා අමුද්‍රව්‍ය උපයෝගී කොට ගත හැකිය. මෙම ප්‍රකාශයට අදාළව විස්තර කළ හැකි සාම්ප්‍රදායික මාධ්‍ය සුවිශේෂීතාව වන්නේ,

(1) තේමාත්මක අන්තර්ගතයයි.
(2) ජනමූල පදනමයි.
(3) සංස්කෘතික සන්දර්භයයි.
(4) නම්‍යශීලිත්වයයි.
(5) අවම පිරිවැයයි.

18. සඟරාවක ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ,

A - සංස්කාරක මණ්ඩලයක් විසින් සැකසීම.

B - වාරානුකූලව ප්‍රකාශයට පත්වීම

C - බොහෝ විට දෛනික තොරතුරු අන්තර්ගත නොවීම.

D - යම් ක්ෂේත්‍රයක් හෝ පාඨක පිරිසක් ඉලක්ක කර ඉදිරිපත් කිරීම.

E - පොදු අන්තර්ගතයක් පැවතීම.

(1) ABCD (2) BCDE (3) ABCE (4) ABDE (5) ACDE

19. නව මාධ්‍ය ලක්ෂණවලට අයත් **නොවන** ලක්ෂණයක් සහිත වරණය වන්නේ.

(1) අංකිතකරණය හා ජාලගතකරණයයි.
(2) අධිපාඨනීයත්වය හා සුපරීක්ෂණයයි.
(3) අන්තර් ක්‍රියාකාරීත්වය හා දත්ත සංචිතකරණයයි.
(4) වේගවත් සන්දේශකරණය හා අධිපාඨනීයත්වයයි.
(5) ජාලගතකරණය හා ස්වයංකරණයයි.

20. නව මාධ්‍ය සම්බන්ධ තොරතුරු හුවමාරුව වර්ග කර දැක්විය හැකි කාණ්ඩවලට අදාළ **නොවන්නේ,**

(1) එක් අයෙකුගේ සිට තවත් අයෙකු තෙක්
(2) බොහෝ පිරිසකගේ සිට බොහෝ පිරිසක් දක්වා
(3) සෙවුම් යන්ත්‍ර භාවිතය
(4) එක් අයකුගේ සිට කිහිපදෙනෙකුට
(5) බොහෝ පිරිසකගේ සිට එක් අයෙකු තෙක්

21. තොරතුරු ගබඩාකර කල් තබා ගැනීමට පදනම සකස් වූයේ,

(1) භාෂා සම්භවය සමගිනි.
(2) ජනමාධ්‍ය ආගමනය සමගිනි.
(3) සන්නිවේදන තාක්ෂණය වැඩි දියුණු වීම සමගිනි.
(4) ලේඛනය ආරම්භයත් සමගිනි.
(5) නවමාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිතය සමගිනි.

22. යම් නිශ්චිත අරමුණක් පෙරදැරිව, නිශ්චිත කාලසීමාවක් තුළ විධිමත්ව සිදු කරන ක්‍රියාවලියක් ලෙස මහජන සන්නිවේදනය දැක්විය හැක. එහි සාර්ථකත්වය උදෙසා යොදාගත හැකි මහජන සන්නිවේදන උපක්‍රමයන් විය හැක්කේ,

A - පෝස්ටර් ප්‍රදර්ශනය.
B - අත්පත්‍රිකා බෙදාහැරීම.
C - ප්‍රදර්ශන පූර්ව භාවිතය.
D - ගුවන් විදුලි සේවාවක් පවත්වාගෙන යාම.
E- ජංගම ප්‍රචාරක රථ භාවිතය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ABCE (5) ACDE

23. ජනප්‍රිය සංස්කෘතිය, මාධ්‍ය සංස්කෘතිය හා ගෝලීය සංස්කෘතිය යන සංස්කෘතික ප්‍රභේදයන්හි දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ,

(1) භූගෝලීය සීමා ඉක්මවා ව්‍යාප්ත වීම.
(2) තාක්ෂණය සමඟ ප්‍රබල සම්බන්ධයක් නොමැති වීම.
(3) නව මාධ්‍යයන්ගෙන් පමණක් ගොඩ නැගී තිබීම.
(4) දේශීය සංස්කෘතික සාධක ආරක්ෂා කිරීම.
(5) අංග ඡේදනය ක්‍රියාත්මක වීම.

24. අන් සියලුම සත්ත්වයන්ගෙන් මිනිසා ගුණාත්මක ලෙස වෙනස්ව හඳුනාගැනීමේ මූලිකම සාධකය වන්නේ,

(1) සන්නිවේදන හැකියාවයි.
(2) භාෂා ශක්‍යතාවන් මත කටයුතු කිරීමයි.
(3) උගත් බවයි.
(4) අධ්‍යාපනය ලැබීමයි.
(5) සංස්කෘතියයි.

25.

| | | | |
|---|---|---|---|
| A | විග්‍රහය | D | පවතින අගයන් විමර්ශනය |
| B | අර්ථ කථනය | E | නිර්මාණය පැහැදිලි කිරීම. |
| C | අගය කිරීම | F | ආකෘතිය විශ්ලේෂණය කිරීම. |

ඉහත ABC හි සඳහන් කාර්ය මඟින් සිදු කරන ක්‍රියාවලිය නිවැරදිව පිළිවෙළින් සඳහන් වී ඇත්තේ,

(1) E D F (2) F D E (3) E F D (4) D F E (5) D E F

26. අන්තර් සංස්කෘතික සන්නිවේදන සංකල්පය උපත ලද වර්ෂය වන්නේ,

(1) 1948 (2) 1952 (3) 1953 (4) 1954 (5) 1960

27. A ජන සංස්කෘතිය - උත්තරීතර සහ පූජනීය සංකේත මත ගොඩනැගී තිබේ.
B සම්භාව්‍ය සංස්කෘතිය - සාමාන්‍ය ජනතාව අතර ප්‍රසිද්ධියක් උසුලයි.
C ජනප්‍රිය සංස්කෘතිය - පහසුවෙන් රස විඳිය හැකි වීම.
D ගෝලීය සංස්කෘතිය - අධිරාජ්‍යවාදී ආකෘතියක් නිර්මාණය කරයි.

ඉහත කරුණු අතර අන්තර් සම්බන්ධතාවක් පවතින හඳුන්වාදීම් ලෙස දැක්විය හැක්කේ,

(1) A හා C (2) B හා D (3) A හා D (4) B හා C (5) C හා D

28. ඵලදායි සන්දේශයක් සඳහා පදනම් වන ප්‍රධාන ගුණාංග අතරට අයත් වන්නේ,

A - සරලබව　　B - විශේෂත්වය　　C - ප්‍රමාණාත්මකබව

D - ව්‍යුහය　　E - ඇලීම

(1) ABCD　(2) BCDE　(3) ABDE　(4) ABCE　(5) ACDE

29. සහජීවනය සඳහා වූ සන්නිවේදනය යනු,

(1) ධනාත්මක සබඳතා ගොඩනැගීමයි.

(2) ප්‍රජා සහභාගිත්වයක් සහිත සන්නිවේදනයක් ඇති කිරීමයි.

(3) සාමාජික ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමයි.

(4) මිත්‍ර සබඳතා යළි යළිත් තහවුරු කිරීමයි.

(5) සහභාගිත්ව සන්නිවේදන වැඩසටහන් සිදු කිරීමයි.

30. බොහෝ රටවල මූලික අයිතිවාසිකම් සඳහා පදනම සකස් කරනු ලැබූ ලියවිල්ල වූයේ,

(1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.

(2) මැක්බ්‍රයිඩ් වාර්තාවයි.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

(4) 1934 ඇමරිකා එක්සත් ජනපදයේ සම්මත කරන ලද සන්නිවේදන පනතයි.

(5) තොරතුරු දැන ගැනීමේ පනතයි.

31.
- මාධ්‍ය සාකච්ඡා පවත්වමින් අනුබද්ධ පාර්ශ්ව දැනුවත් කිරීම.
- අවස්ථාවක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- බාහිර මහජන සම්බන්ධතා වර්ධනය කිරීම.
- අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් අතර මනා සම්බන්ධතාවක් ඇති කිරීම

ඉහත දක්වා ඇති කාර්යය සඳහා ඍජුව මැදිහත්ව කටයුතු කළ යුතු නිලධාරින්ගේ පිළිවෙළ වන්නේ,

(1) මාධ්‍ය ප්‍රකාශක, සිද්ධි කළමනාකරු, මහජන සම්බන්ධතා නිලධාරි, මාධ්‍ය නිලධාරි

(2) මාධ්‍ය ප්‍රකාශක, සිද්ධි කළමනාකරු, මාධ්‍ය නිලධාරි, මහජන සම්බන්ධතා නිලධාරි

(3) සිද්ධි කළමනාකරු, මාධ්‍ය ප්‍රකාශක, මාධ්‍ය නිලධාරි, මහජන සම්බන්ධතා නිලධාරි

(4) මාධ්‍ය ප්‍රකාශක, මාධ්‍ය නිලධාරි, සිද්ධි කළමනාකරු, මහජන සම්බන්ධතා නිලධාරි

(5) මාධ්‍ය නිලධාරි, සිද්ධි කළමනාකරු, මාධ්‍ය ප්‍රකාශක, මහජන සම්බන්ධතා නිලධාරි

32. 'යම් නිමැවුමක් සඳහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් හෝ භාවිත කිරීම නිර්මාණශීලීත්වයයි.' නිර්මාණය පිළිබඳ මෙම අදහස් ඉදිරිපත් කොට ඇත්තේ,

(1) ලියනාඩෝ ඩාවින්චි　(2) ලියෝ ටෝල්ස්ටෝයි

(3) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය　(4) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

(5) ජේම්ස් වොට්සන්

33. ගුවන් විදුලි මාධ්‍ය වැඩසටහන් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු අතරට ගත **නොහැකි** වන්නේ,

(1) එක් වරකින් තේරුම් ගැනීමට හැකිබව. (2) විස්තරාත්මක වාක්‍ය යොදා ගැනීම.

(3) සවන කේන්ද්‍රීය එළඹුම. (4) සරලබව.

(5) ඉලක්ක ග්‍රාහක අත්දැකීම් පසුතලයට ආමන්ත්‍රණය.

34. රචකයාගේ පරිකල්පනයේ පළමුව ලෝකයක් නිර්මාණය කොට ගෙන, දෙවනුව ඒ ලෝකය අසන්නන්ගේ පරිකල්පනය පුබුදු කිරීම කලාවක් ලෙස හඳුන්වා ඇත්තේ,

(1) කථන කලාවයි. (2) නිවේදන කලාවයි.

(3) ප්‍රාසාංගිකත්වයයි. (4) ගුවන් විදුලියේ නිර්මාණශීලීත්වයයි.

(5) රූපවාහිනී නිවේදක කාර්ය භාරයයි.

35. රංග කලාවේ මූලිකාංග අතර තාක්ෂණික මූලිකාංගවලට අදාළ යොමුවීම් ලෙස දැක්විය හැක්කේ,

A - ජවනිකා B - ඇඳුම් C - ආලෝකය

D - වේශ නිරූපණය E - කතා වස්තුව හා එහි ආකෘතිය

(1) ABCD (2) BCDE (3) ABCE (4) ABDE (5) ACDE

36. සංවර්ධන සංකල්පය තුළ දියුණු රටවල ආර්ථිකය මත යැපීමෙන් නොදියුණු රටවල් දියුණු කරගත හැකිබව පෙන්වා දුන්නේ,

(1) නවීකරණ න්‍යායයි. (2) පරායත්තතා න්‍යායයි.

(3) නවෝත්පාදන විසරණ න්‍යායයි (4) ස්වායත්තතා න්‍යායයි.

(5) තිරසර සංවර්ධන න්‍යායයි.

37. සමීක්ෂණ ක්‍රියාවලියේදී දත්ත විශ්ලේෂණය කිරීම සඳහා දත්ත සැකසීමට යොදාගත හැකි ක්‍රම අතරට ගත **නොහැකි** වන්නේ,

(1) ප්‍රතිශත (2) මධ්‍යස්ථය (3) නියැදිය (4) අනුපාත (5) වගු

38. කිසියම් දෙයක් හෝ සංසිද්ධියක් පිළිබඳ විමසීම හා සෙවීම මගින් සත්‍යතාව ඔප්පු කිරීම සඳහා වන ක්‍රියාවලියක් ලෙස පැහැදිලි කරනු ලබන්නේ,

(1) සමීක්ෂණයයි. (2) පර්යේෂණයයි. (3) ගවේෂණයයි.

(4) තර්කනයයි. (5) විමසිලිමත්බවයි.

39. අන්තර්ජාල භෞතික උපාංග හා දෛනික සන්නිවේදන ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාවක් ඇති කළ මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතාව වන්නේ,

(1) වලාකුළු පරිගණක භාවිතයයි.

(2) ප්‍රතිසම තාක්ෂණයෙන් සංඛ්‍යාංක තාක්ෂණයට පැමිණීමයි.

(3) පැරණි මාධ්‍ය, නව මාධ්‍ය බවට පත් වෙමින් තිබීමයි.

(4) ඒක මාධ්‍යවලින් බහු මාධ්‍යවලට පැමිණීමයි.

(5) අන්තර්ජාල වස්තු භාවිතයයි.

40. සන්නිවේදනයේදී ක්‍රියාකාරකම් ගණනාවක් තුළින් අවසන් ක්‍රියාව වෙත යොමු වීමට සිදුව ඇත්තේ,

(1) අරමුණු සහගත වන නිසාය.
(2) සංකේතාත්මක වන නිසාය.
(3) සන්දර්භානුගත වන නිසාය.
(4) ක්‍රියාපටිපාටියක් වන නිසාය.
(5) විවිධාකාර වන නිසාය.

41. අප රටේ ප්‍රධාන සංස්කෘතික හා කලා නිකේතනය වී පැවති මාධ්‍ය වූයේ,

(1) පුවත්පතයි.
(2) ගුවන් විදුලියයි.
(3) සිනමාවයි.
(4) රූපවාහිනියයි.
(5) පොතයි.

42. " ව්‍යාපාරිකයින් හා දැන්වීම්කරුවන් මාධ්‍ය අන්තර්ගතය තම බලපෑමට අනුව හසුරුවා ගැනීමට යොමුවීම දැකිය හැකි දෙයකි." ඉහත ප්‍රකාශය තුළින් උද්දීපනය වන්නේ,

(1) වාණිජකරණයයි.
(2) ගෝලීය කරණයයි.
(3) භාණ්ඩකරණයයි.
(4) පාරිභෝජ්‍යකරණයයි.
(5) මාධ්‍ය අභිසාරිතාවයි.

43. මහා භාණ්ඩාගාරය සතුව පැවැති, ඩොලර් මිලියන ගණනක මුදල්, හැකර්වරුන් අතට පත්වී ඇතිබව සෑම මාධ්‍යයකම මෑතකාලීන ප්‍රධාන පුවතක් විය. මෙවැනි අවස්ථාවකදී, අදාළ කටයුතු පරීක්ෂා කිරීම සඳහා සහයෝගය ලබාගත යුතු ආයතනය වන්නේ,

(1) වි දුලි සන්දේශ නියාමන කොමිසම.
(2) ශ්‍රී ලංකා පොලිසිය.
(3) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය.
(4) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය.
(5) ජාත්‍යන්තර පොලිසිය.

44. මාධ්‍ය නියාමනය මඟින් තහවුරු කර ගැනීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්තිමය අරමුණක් **නොවන්නේ,**

(1) බහුත්වවාදය. (2) විවිධත්වය. (3) ප්‍රගතිශීලීභාවය. (4) තරගකාරීත්වය. (5) නිදහස.

45.

| | **කාර්යය** | | **ආයතනය** |
|---|---|---|---|
| A | නිර්මාණකරණය සඳහා නීතිමය ආරක්ෂාව. | 1 | විදුලි සංදේශ නියාමන කොමිසම. |
| B | රාජ්‍ය ආයතනවල වගකීම සොයා බැලීම. | 2 | බුද්ධිමය දේපළ පිළිබඳ කාර්යාංශය. |
| C | විද්‍යුත් මාධ්‍ය සඳහා බලපත්‍ර ලබාදීම. | 3 | තොරතුරු දැනගැනීමේ කොමිසම. |
| D | සයිබර් අපරාධ සඳහා ප්‍රතිචාර දැක්වීම. | 4 | පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය. |

ඉහත කාර්යය සිදුකිරීමේදී ක්‍රියාත්මක ආයතනයන් විධිමත්ව දැක්වෙන්නේ,

(1) A 2, B 3, C 4, D 1
(2) A 2, B 3, C 1, D 4
(3) A 3, B 2, C 1, D 4
(4) A1, B 2, C 3, D 4
(5) A 2, B 1, C 3, D 4

46. සියලු ජීවීන්ගේ පැවැත්ම සහතික කිරීමට සංවර්ධනය උදෙසා සන්නිවේදනය යොදා ගැනීමෙන් ඉටුකර ගැනීමට පදනම් වන අපේක්ෂාව වී ඇත්තේ,

(1) අවශ්‍යතා කේන්ද්‍රියත්වයයි.
(2) ස්වයංනිර්ණයයි.
(3) ස්වයංවිශ්වාසයයි.
(4) යහපත් පරිසරයක් ගොඩනැගීමයි.
(5) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයයි.

47. කාර්මික විප්ලවයෙන් පසු යුරෝපයේ මහජන සම්බන්ධතා සංකල්පය ව්‍යාප්ත වූයේ,
(1) මහජනතාව හා කර්මාන්ත සම්බන්ධ කෙරෙන්නක් වශයෙනි.
(2) අලෙවිය ඉහළ නංවාගත හැකි දැන්වීම්කරණ විධික්‍රමයක් වශයෙනි.
(3) කර්මාන්ත හා රජය අතර සම්බන්ධය තහවුරු කිරීමක් වශයෙනි.
(4) ව්‍යාපාරික සම්බන්ධතා ශක්තිමත් කෙරෙන්නක් වශයෙනි.
(5) පාලකයන් හා සේවකයන් අතර ගැටුම් කළමනාකරණය කරන්නක් වශයෙනි.

48. මහජන සම්බන්ධතා හා ඊට අදාළ කාර්යයක් බැගින් දැක්වෙන ප්‍රකාශ යුගල කිහිපයක් පහත දැක්වේ.

A - 1. මාධ්‍ය මහජන සම්බන්ධතා
2. බලපත්‍ර ලබාදීම

B - 1. වෘත්තීය මහජන සම්බන්ධතා
2. පර්යේෂණ හා දැනුම

C - 1. ආයතනික මහජන සම්බන්ධතා
2. රාජ්‍ය සම්බන්ධතා

D - 1. රාජ්‍ය මහජන සම්බන්ධතා
2. ආචාර ධර්ම පද්ධති

ඉහත ඒවා අතරින් වඩාත් සමීප සම්බන්ධතාවක් දක්වන යුගල ඇතුළත් වරණය වන්නේ,
(1) A හා B ය. (2) A B හා C ය.
(3) B හා C ය. (4) B C හා D ය. (5) A B C හා D යන සියල්ලම ය.

49. මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ සිසුන් දැක්වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

සංදීප - සන්දේශය පිළිගැනීමට ලක් කොට ඉදිරිපත් කොට ඇති ආකාරය හඳුනාගත යුතුයි.
සංඛ - විශේෂිතව ඉදිරිපත් කොට ඇති දේ වෙන් කර ගැනීම කළ යුතුයි.
නදුල - සන්දේශය කෙරෙහි විශ්වසනීයත්වය ඇති කොට ඇති ආකාරය හෙළි කරගත යුතුයි.
දිනුක - සන්දේශයට අදාළ සාධක එක්තැන් කොට ඉදිරිපත් කර ඇද්දැයි පැහැදිලි කර ගත යුතුයි.

ඉහත දක්වා ඇති ප්‍රකාශ මගින් පැහැදිලි වන සන්දේශයක් විශ්ලේෂණය කිරීමේදී, අවධානය යොමු කරන මූලික කරුණු ලෙස පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) අර්ථය, අදාළබව, පෙලඹවීම, සඵලතාව.
(2) විශ්වසනීයත්වය, පක්ෂපාතිත්වය, අදාළබව, පෙලඹවීම.
(3) පක්ෂපාතිත්වය, විශ්වසනීයත්වය, පෙලඹවීම, අදාළබව.
(4) විශ්වසනීයත්වය, පෙලඹවීම, පක්ෂපාතිත්වය, අදාළබව,
(5) විශ්වසනීයත්වය, පක්ෂපාතිත්වය, පෙලඹවීම, අදාළබව.

50. චිත්‍රපටයක් නිර්මාණය සඳහා පදනම් වන තිර රචනයක් සැකසීමේදී ඒ සඳහා යොදා ගනු ලබන භාවිතයන් ලෙස දැක්විය හැක්කේ,

A - දෘශ්‍ය මෝස්තර B - චල චින්දන C - රූපක D - ශබ්ද E - සංකේත

(1) ACE (2) BCD (3) BCE (4) ACD (5) ADE